www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුද්ධයෙන් පීඩිත වූ යාපන වැසියන්ට සුනාමි රල පහරින් දැඩි හානි

## People of war-ravaged Jaffna hit hard by tsunami

**තිරුඥාන සම්බන්ධන් සහ රාජේන්ද්‍රන් සුදර්ශන් විසිනි**
**2005 ජනවාරි 10**

ශ්‍රී ලංකාවේ වෙරලාසන්න කලාපවලට එල්ල වූ සුනාමි රල පහරින් යාපන අර්ධද්වීපයේ උතුරු ප්‍රදේශවලට දරුනු විනාශයක් සිදු කලේ ය. ආපදා කලමනාකරන මධ්‍යස්ථානයේ සංඛ්‍යාලේඛනවලට අනුව, 541 කට තුවාල සිදු වූ අතර 540 දෙනෙක් අතුරුදහන්ව 2640 කට මරු කැඳවී ය. 50,000 කට ආසන්න උන්හිටි තැන් අහිමි වූ ජනයා අර්ධද්වීපයේ කඳවුරු 32 ක පදිංචිකරවා ඇත. තවත් 150,000ක් සිය නෑදෑ හිතවතුන්ගේ නිවාසවල රැකවරන ලබන බව වාර්තා වේ.

කොලඹින් කි.මී. 420 ක දුරින් පිහිටි, විසි අවුරුදු සිවිල් යුද්ධයකින් දැනට මත් අලාභහානි වීඇති, වැල්වෙට්තුරෙයි සහ පේදුරු තුඩුව ඇතුලු වඩමාරච්චි ප්‍රදේශයේ, මුහුද ගොඩගැලීමෙන් කි. මී. 18ක් පලල වූ වෙරලාසන්න කලාපයක් විනාශ වී ගියේ ය. දෛනික වියහියදම් වෙනුවෙන් ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයින් විශාල ප්‍රමානයක් ප්‍රදේශය පුරා ජීවත් වේ. යුද කාල සීමාවේ දී, සමහරවිට යුද්ධයෙන් බේරී පලා යාමටත් වසර ගනනාවකට පසු නැවත පදිංචිවීමත් නිසා, ගම්මුන් තදබල ලෙස කරදරයට පත් විය. යුද නියමයන්හි කොටසක් ලෙස ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ප්‍රකාශ කෙරුනු මසුන් මැරීම තහනමකටත් ඔවුහු ලක්වුන අතර තවමත් මුහුදු යාම සඳහා අවසර ලබා ගත යුතු ය.

දිවයිනේ උතුරු කොනේ ම පිහිටි වඩමාරච්චි, දැන් යුද හමුදාව විසින් මහ ජනතාව සඳහා සීමා පනවමින්, ''දැඩි ආරක්ෂිත කලාපයක්'' ලෙසට ප්‍රකාශයට පත් කොට ඇත. සෑම මීටර 100න් 100ට ම මුර පොලවල් ඉදිකර ඇත. නැගෙනහිර වඩමාරච්චි හි ඉතා කුඩා කොටසක් දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයේ පාලනයේ පවතී.

මනට්කාඩු, මරුදන්කෙනි, මුනායි, සුපර්මඩම්, නාගර්කොවිල්, පොලිකන්ඩි වැනි වෙරලාසන්න ගම් 20ක දහස් ගනන් වූ ජනතාවක් මුහුදට ගසාගෙන ගොස් ඇත. දෙසැම්බර් 28 දා, ලෝසවෙඅ නියෝජිතයෝ, සුනාමියෙන් දැඩි විනාශයකට බඳුන් වූ මනට්කාඩු හි සංචාරයක යෙදුනහ. ගමේ ජනගහනයෙන් 1/10ක් පමන වූ, අඩු තරමින් ජීවිත 100ක් පමන, කි.මී. 1.5ක් පමන රට තුලට ගොඩගැසුනු උස්වූ රල පහරින් ගසාගෙන ගිය ආකාරය ජීවිත බේරාගත් අය විසින් විස්තර කරන ලදි. පිදුරු සෙවිල්ලන ලද ගෙවල්වලින් 3/4ක්ම විනාශ වී ගොස් ඇත.

මුහුදට සේදී ගිය මනට්කාඩු ග්‍රාමීය පාසලේ විදුහල්පති කුරුගුලසිංහම් පැවසූ ලෙසට අඩුම තරමින් පාසල් ලමුන් 50 ක ජීවිත විනාශ වී ඇත. ''එය පාසල් දිනයක් වූයේ නම් පාසල් ලමුන් සමග අප බොහෝ දෙනෙකුගේ ජීවිත විනාශවන්නට ඉඩ තිබුනි. බොහෝ දෙනෙක් තවමත් හමුවී නැත. රජය තවමත් කිසිම ආධාරයක් දී නොමැති බව ද'' ඔහු පැවසීය.

එම කනගාටුදායී සිදුවීමෙන් පසු දින, මන්ඩිහායි රෝහලට මල සිරුරු 100ක් ගෙන එන ලදී. පවුල් 532කට ආසන්න ප්‍රමානයක් රෝහල තුල රැකවරන ලබා පසුව අනෙකුත් අනාත කඳවුරු වෙත රැගෙන යන ලදි. ගැමියන්ගෙන් බොහෝ දෙනෙක් දැනට වඩමාරච්චි හින්දු කාන්තා විද්‍යාලයේ රැකවරන ලබති.

ලෝසවෙඅ නියෝජිතයෝ මුනායි ගම්වැසියන් රැකවරන ලබන කඳවුර වෙත ගියහ. කඳවුරේ ග්‍රාම නිලධාරි: කුමාරගුරුට අනුව ''මේ මිනිස්සු එම කනගාටුදායී සිදුවීමෙන් වැනසිලා. නමුත් රජය අපට තවමත් ආධාර එවා නැහැ. මේ අවට සිටින මිනිසුන් තමයි උදව් කරන්නේ.

''මෙතන පවුල් 256ක් ඉන්නවා. අපි දන්නේ නැහැ තව කොයි තරම් දුරකට අපට ඔවුන්ට කෑමත් සෞඛ්‍ය පහසුකමුත් සපයන්න පුලුවන්ද කියලා. ඔවුන්ව නැවතත් පදිංචි කරවන්න රු. මිලියන 10ක් පමන වියදම් කරන්න වේවි. මරුදන්කෙනි සහ මනට්කාඩු ගම්මාන සම්පූර්නයෙන්ම විනාශවෙලා නිසා ඔවුන්ට ගෙවල් දොරවල් නෑ.

''මෙතන අපට ඉඩකඩ තියෙන්නේ පවුල් 100කට පමන නමුත් පවුල් 250කට වඩා මෙතන ඉන්නවා. අපි ප්‍රාදේශීය ලේකම්ට මේ ගැන දැන්වුවා. නමුත් ඔවුන් තවමත් නිශ්ශබ්දයි. මෙතන මිනිස්සු 750ක් පමන සිටියත් අපට තියෙන්නේ වැසිකිලි 4ක් පමනයි. අපි දැනට තාවකාලික වලවල් 4ක් වැසිකිලි විදියට පාවිච්චියට හදල තියෙනවා. ඒකයි අපට සෞඛ්‍ය පහසුකම් නඩත්තු කරන්න බැරි.''

ඊලඟ තර්ජනය තමයි බිම් බෝම්බ, ඔහු විස්තර කලේ ය. යුද හමුදාව විසින් සවි කෙරුනු බිම් බෝම්බ

සුනාමියට හසු වී අනිත් පැතිවලත් හැම තැනම විසිරිලා. ශ්‍රී ලංකාවේ නැගෙනහිර පැත්තේ කොටස්වලත් මෙම භයානක තත්වය තියෙනවා.

ලෝසවෙඅ මුනායි හා සුපර්මඩම් ඇතුලු අනෙකුත්, සුනාමි රල පහරින් විනාශ වූ ප්‍රදේශවලද සංචාරය කලේ ය. එම ගම්වල ද බොහෝ දෙනා මියගොස් ඇති අතර, බෝට්ටු හා දැල් ඇතුලු සියලුම ධීවර ආම්පන්න විනාශ වී ගොස් ඇත.

සිය පැවැත්ම සඳහා ප්‍රදේශයේ දානපතියන්ගෙන් යැපෙන ධීවර පවුල් තුල රජයෙන් හෝ එල්ටීටීඊයෙන් උදව් ලැබෙතැයි විශ්වාසයක් නොමැත. සමහරුන් එල්ටීටීඊය තමන්ගේ ජීවිත නැවත ගොඩ නගා ගැනීම සඳහා උදව් කරතැයි විශ්වාසයෙන් පසුවෙතත්, අනෙක් උදවිය සිය අනාගතය පිලිබඳ අවිනිශ්චිත භාවයෙන් පසුවෙති. සුපර්මඩම්හි එක් ධීවරයෙක් මෙසේ පැවසීය. ''අපිට නැගී සිටින්නට අඩුම තරමින් තව අවුරුදු 10ක් වත් යාවි. මේ මිනිස්සු අපිට තව කොච්චර කාලයක් උදව්කරාවි ද? '' තවත් කාන්තාවක් මෙසේ පැවසුවා ය. ''මේ මිනිස්සු තව කොච්චර දවසක් අපිට බත් දේවි ද? ''

උතුරු හින්දු කාන්තා විදුහලේ රැකවරන ලබන සුපර්මඩම්හි එස්. ඉන්දිරාලිංගම් සිය අදහස් මෙසේ ප්‍රකාශ කලේ ය. ''අපි විශ්වාස කරන්නේ නැහැ අපේ ජීවිත නැවත ගොඩනගන්නට කවුරුහරි අපට උදව් කරයි කියලා. මොකද යුද්දෙන් අපිට නැතිවුන දේවල්වලට වන්දි අපිට කවුරුත් දුන්නේ නෑ. දැන් මෙම ව්‍යසනය මුලු දිවයින වටේටම වෙලා තියෙනවා. බොහෝ දුරට එය බලපෑවේ ධීවරයන්ට. යුද්දෙ කාලෙදි බලධාරින් මසුන් මැරීම තහනම් කලා. මේ පාරත් අපිට මයි මෙම විනාශයට මුහුන දෙන්න සිද්ධ වුනේ.''

අවුරුදු 15ක් සරනාගතයෙක් ලෙස ඉන්දියාවේ ගතකර මෑතක දී දිවයිනට පැමිනි කාන්තාවක් කීවේ ''අපි බෝට්ටුවකින් මන්නාරමට (උතුරු දිස්ත්‍රික්කයේ වෙරලාසන්න නගරයක්) ආවේ මාස හතරකට කලින්. අපට තාම කවුරුත් උදව් කලේ නෑ. මගේ ගෙදර මූදට කිට්ටුවෙන් තිබුනේ. රැල්ල මාවත් මගේ දරුවත් නැවත නැවතත් පෙරෙව්වා. අප දෙවියන්ගේ බලයෙන් දිවි ගලවා ගත්තා. මට සේරම නැතිවුනා.''

දරු තිදෙනෙකුගේ වැන්දඹු මවක් වන පුෂ්පමාලර් අනාගතය සම්බන්ධ තම බිය මෙසේ එලිදැක්වූයේ ය. ''මම වැන්දඹුවක්. මාලු තෝරන්න උදව්කරල ධීවරයන්ගෙන් මට දිනකට ලැබෙන්නෙ රු. 50 හෝ 100ක් (ඇ.ඩො. ශත 50 හෝ 100). දැන් අපි කොහොමද ජීවත් වන්නේ. රජය අපට තාම කිසිම ආධාරයක් දීල නෑ. එයාලා උදව් කරයි කියලා මට විශ්වාසයකුත් නෑ. මේ මිනිස්සුන්ට (ප්‍රාදේශීය ස්වෙච්ඡා සේවකයන්) තව කොච්චර දවසක් මහ ජනතාවගෙන් එකතු කරලා අපිව රැක බලා ගන්න පුලුවන් වෙයිද? මරනය ඇරෙන්න අපිට වෙන දෙයක් ඉතිරි වෙලා නෑ.''

මන්ඩිහායි රෝහලට ඇතුලත් කරනු ලැබ සිටින මනට්කාඩුහි ලුයිස් මේරිට සිය මාස දහයක් වයසැති බිලිඳා නැතිවිය. එම ශෝකාන්තය ඇය මෙසේ කඳුලට හරවයි. ''රැල්ල දකිනකොට ම මම මගේ ලමයිනුත් සමග දුවන්න පටන් ගත්තා. මට රල පහර වැදුනත් මම ලමයින්ව අත හැරියේ නෑ. තල් ගහක් බිම වැටෙනවා දැකපු භීතියට මට දරුවා නැතිවුනා''

බෝට්ටුව, දැල්, සහ සිය නිවස ඇතුලු සියල්ලම සිය පවුලට අහිමි වූ බව ටී ඉන්ද්‍රානි පැවසුවා ය. ඇය සිය දරුවන් බේරා ගැනීම සඳහා ඉමහත් උත්සාහයක නිරතවේ. ''යුද්ධයෙන් අපිට නැතිවූ රැකියා නැවත ගොඩගැනීම සඳහා අරයටයි මෙයාටයි හිස නමන්න අපට සිද්ධවුනා. දැන් අපි මොකද කරන්නේ: තුන් දරු මවක වන සුගන්ති පැවසුවේ ''බැංකුවෙන් නයක් අරගෙන අපි බෝට්ටුව සහ දැල් ගත්තා. අපි දැන් කොහොමද ඒ නය ගෙවන්නේ. අපිට රක්සාවල් තියෙනවනම් විතරයි ආපහු ගෙවීමට කල හැකි වන්නේ.''

සුපර්මඩම්හි මැදි වයසේ ධීවරයෙක්වන ගෝපාලසිංහම් මෙසේ පැවසුවේ ය. ''මම විශ්වාස කරන්නේ නෑ කිසිම අයෙක් අපේ ජීවිත ගොඩනගා ගන්න උදව් කරයි කියලා. 1989 දී ඉන්දියානු සාම හමුදාවත් (1987 ඉන්දු ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු හමුදාව ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ආක්‍රමනය කලේ ය.) එල්ටීටීඊයත් අතර යුද්ධය පටන්ගත්තට පස්සේ මගේ ධීවර ආම්පන්න විනාශ වුනා. ඊලගට 1995 දී, සන්ධාන ආන්ඩුව යටතේ මෙහෙයවුන රිවිරැ ස හමුදා මෙහෙයුමේ දී මගේ සියලු ධීවර ආම්පන්න නැවත විනාශ වුනා.''

''පිටපිට මවිසින් ආයාචනා කලත්, අදවන තුරු ආන්ඩුව කිසිම උපකාරයක් කරලා නැහැ. එම ලියුම් ටයිප් කරන්න ගිය මුදල් පවා අපතේ ගියා. එම නිසා අපි කොහොමද විශ්වාස කරන්නේ ආන්ඩුව මේ වෙලාවේ අපේ උදව්වට ඒවි කියලා.''

අපේ සංචාරයේ දී ලෝසවෙඅ නියෝජිතයන්ට කිසිම රජයේ හෝ විදේශීය ආධාර කන්ඩායම් මුන ගැසුනේ නැත. ආධාර තදින්ම අවැසි වූවන්ට, ආහාර සහ අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සපයන්නට බොහෝ සෙයින්ම ඉදිරිපත්වී සිටියේ ප්‍රදේශයේ ජනතාව සහ කලාපීය සංවිධානයි. දිවි ගලවා ගත්තවුන් සහ සුන්බුන්වලින් වැසුනු මලකඳන් සෙවීම සඳහා යෙදී සිටියේත් සාමාන්‍ය ජනතාවයි.

© www.wsws.org